# 1 වන පරිච්ඡේදය

## 1. 1 මාතෘකාව හැඳින්වීම.

ජනමාධ්‍ය වෘත්තිය මාර්ගෝපදේශ (code of ethics) ජනමාධ්‍ය කරුවන්ට තම කටයුතු ඵලදායි කරගැනීම සඳහා තිබේ. මෙම මාර්ගෝපදේශ ජනමාධ්‍ය ආචාරධර්ම, "Code of Practice in mass media" වැනි නම් වලින්ද හඳුන්වයි. එමගින් ජනමාධ්‍ය නිදහස වගකීමෙන් යුතුව භාවිතා කිරීමට ජනමාධ්‍යකරුවන්ව පොළඹවයි. මේ අනුව ජනමාධ්‍ය වෘත්තිය මාර්ගෝපදේශ, සමාජ වගකීම් සහ ජනමාධ්‍ය නිදහස යන දෙකම මත පදනම්ව ඇත. මෙය එකම කාසියේ දෙපැත්ත ලෙස හැඳින්විය හැක. ජනමාධ්‍ය නිදහස යනු ඕනෑම මාධ්‍යකින් කිසිම බාධාවකින් තොරව, තොරතුරු දීමට මෙන්ම ලබා ගැනීමට ඇති අයිතියක් බව නිදහස් මතවාදී සංකල්පයටද අනුව පිළිගැනේ (සෙනරත්, 2001). මිනිසුන්ට තම අදහස් ප්‍රකාශ කිරීමට අයිතියක් තිබිය යුතු බව මුල්වරට පිළිගනු ලැබුවේ 1215 මැග්නාකාර්ටා හෙවත් මහාඅධිකාර පත්‍රය මගිනි (තෙන්නකෝන්, 2003). වර්තමානයේදීද ජාත්‍යන්තරව එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වන වගන්තිය මගින් භාෂණය ඇතුළු අදහස් පළකිරීමේ නිදහසට හිමිකම ලැබී ඇත (රාජපක්ෂ, 2008 ; තෙන්නකෝන් 2003). මෙලෙස ජාත්‍යන්තරව පිළිගනු ලැබු භාෂණය හා ප්‍රකාශණයේ නිදහස 1972 පළමුවන ජනරජ ව්‍යවස්ථාව හා 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකාවේද පිළිගෙන ඇත. (රාජපක්ෂ, 2008). එම නිදහස තුළ ජනමාධ්‍ය නිදහස අන්තර්ගතව ඇත. මෙලෙස ජනමාධ්‍යන්ට නිදහස තිබු පමණින් එය අසීමාන්තිකව භාවිතා කළ හැකිද යන්න ගැටලු සහගතයි. ජනමාධ්‍යන් ලබාදෙන තොරතුරු සමාජයේ ජිවත්වන පුද්ගලයන්ගේ උපරිම යහපතට හේතු වන අයුරින් ලබාදිය යුතුය.

1982 දී චොරන් ඇගී සන්නිවේදනය අර්ථ දක්වන්නේ තොරතුරු, අදහස් හා ආකල්ප එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට සම්ප්‍රේෂණය කිරීමක් ලෙසයි (කරුණානායක, 2003). තොරතුරු, ආකල්ප, අදහස් හෝ චිත්තවේග හුවමාරුකර ගැනීම හෝ බෙදාහදා ගැනීම සන්නිවේදනය ලෙස ස්වෙන් වින්ඩාල් හා බෙනෝ සිග්නිට්සර් 1999 දී අර්ථ දක්වයි (කරුණානායක, 2003). මෙම නිර්වචන වලින්ද තහවුරුවන පරිදි සන්නිවේදනයේ මූලික අරමුණ වන්නේ තවත් පුද්ගලයෙකුට අවබෝධ වන පරිදි අදහස් ඉදිරිපත් කිරීමයි.

අද ලෝක සමාජය තුළ ත්‍රස්තවාදය ව්‍යාප්තව ඇත. එනම් ත්‍රස්තවාදය ගෝලිය ප්‍රපංචයකි (ධනපාල,2006). ඇමරිකාව, මහාබ්‍රිතාන්‍ය වැනි ලෝකයේ දියුණු රටවල් මෙන්ම ඇෆ්ගනිස්ථානය, ඉන්දියාව, පකිස්ථානය වැනි ලෝකයේ බොහෝ රටවල් තුළ ත්‍රස්තවාදී කටයුතු ව්‍යාප්ත වී ඇත. නෙතන්යානු සඳහන් කරන පරිදි ත්‍රස්තවාදය යනු දේශපාලනික ඵලප්‍රයෝජනය සඳහා සිතාමතා සහ ක්‍රමානුකූලව සිවිල් ජනතාවට හිරිහැර කිරීමයි (ධනපාල, 2006, පි. 8). 2009 මැයි 18 වනදා මුලතිවු වෙල්ලමුල්ලිවයික්කාල්හිදී ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි සංවිධානය පරාජය කරන තුරු ශ්‍රී ලංකාව තුළ ද අති විශාල මිනිස් ජිවිත, දේපළ විනාශ කරමින් ත්‍රස්තවාදය පැවතින. සමහරු ශ්‍රී ලංකාවේ පැවති එම අර්බුදය ත්‍රස්තවාදයක් ලෙසත් සමහරු එය ජනවාර්ගික අර්බුදයක් ලෙසත් හඳුන්වනලදී. මෙම පර්යේෂණ නිබන්ධිකාව සිදු කළේ පැවති එම අර්බුදය, ත්‍රස්තවාදයක් යන මතවාදයේ සිටය. ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය එරෙහි යුද්ධය පැවති සමයේ ජනමාධ්‍ය

කටයුතු කළ ආකාරය මතභේදයට ලක් වී ඇත. ජනමාධ්‍ය තුළින්ද ත්‍රස්තවාදය ව්‍යාප්තවූ බව බොහෝ විද්වතුන්ගේ අදහස විය. යුධ ගැටුම් වාර්තාකරණයේදී ජනමාධ්‍ය වෘත්තිය මාර්ගෝපදේශ අනුගමනය කිරීමද අභියෝගයට ලක් වී තිබේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදයට එරෙහිව අවසන් යුධ සමයේ මෙම තත්වය බහුලව සිදු වූ බව විද්වත් මතයයි. යුද්ධය කෙතරම් බිහිසුණු වුවද එහි තොරතුරු දැනගැනීමට ජනතාවට දැඩි කුතුහලයක් තිබුණි. මේ නිසා ජනමාධ්‍ය තුළින්ද ආකර්ෂණීය ලෙස ජනතාවට යුධ පුවත් ගෙනෙන ලදී. ජනමාධ්‍ය අතර තරඟකාරීත්වය යුධ පුවත් සම්බන්ධයෙන් තිබුණි. මේ මත පෝල් ඩී මැසනියර් සඳහන් කළ පරිදි ප්‍රවෘත්තියක තිබිය යුතු නිරවද්‍ය බව, සමබර බව හා නිරවුල් බව ගිලිහියාම තුළ ජනමාධ්‍ය වල විශ්වාසනීයත්වය නැති වී තිබේ. තරඟකාරීත්වය, දේශපාලනීකරණය හා ව්‍යපාරික අරමුණු මත ජනමාධ්‍ය වෘත්තිය මාර්ගෝපදේශ අභියෝගයට ලක් වී ඇත. මේ නිසා ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදයට එරෙහි අවසාන යුද්ධය, ජනමාධ්‍යකරුවන්ගේ වෘත්තිය මර්ගෝපදේශ භාවිතය කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳව අධ්‍යනය කිරීම කාලෝචිත බව පර්යේෂකගේ අදහස විය.

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ත්‍රස්තවාදයට එරෙහි අවසාන යුද්ධය ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යකරුවන්ගේ වෘත්තිය මාර්ගෝපදේශ කෙරෙහි බලපෑ ආකාරය සොයා බැලීමයි. එම අවසාන යුද්ධය ආවරණය කිරීමේදී ජනමාධ්‍යකරුවන් වෘත්තිය මාර්ගෝපදේශ පිළිපැද්දේද යන්නත්, යුද්ධය වාර්තා කිරීම ග්‍රාහකයාට බලපෑ ආකාරයත්, ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතියට යුධ වාර්තාකරණයේ බලපෑ ආකාරයත් වැනි අභිමතාර්ථ ඉහත මූලික අරමුණ අනුව පර්යේෂණය සිදු කිරීමේ දී පාදක විය. එම අරමුණු හා අභිමතාර්ථ සාධනය කරගැනීම සඳහා ගැටලුව වූයේ ත්‍රස්තවාදයට එරෙහි අවසාන යුධ සමයේ ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යකරුවන් වෘත්තිය මාර්ගෝපදේශ ක්‍රියාවට නැංවූයේ කුමන අයුරින්ද යන්නයි. මෙම ගැටලුව අනුව පර්යේෂණය සිදු කිරීමේදී ත්‍රස්තවාදයට එරෙහිව යුධ සමයේ ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යකරුවන් අතින් වෘත්තිය මාර්ගෝපදේශ භාවිතය නව තත්වයකට මුහුණ දුන්නේය යන උපන්‍යාසය මත පිහිටා පර්යේෂණ කටයුතු සිදු කරන ලදී. මෙම උපන්‍යාසය පරීක්‍ෂා කිරීමට දත්ත එකතු කිරීම සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රමවේදවලට අයත් සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි ක්‍රමවේද මගින් අවශ්‍ය දත්ත ලබාගන්නා ලදී. ඒ අනුව ලද දත්ත විශ්ලේෂණය කිරීම තුළින් පැහැදිලි වූයේ පර්යේෂණයට අදාළ උපන්‍යාසය තහවුරු වූ බවයි. ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදයට එරෙහිව යුද්ධය අවසන් වූවාට පසුව ජනමාධ්‍යවල ක්‍රියාකාරීත්වය, හැසිරීම පිළිබඳව ජනමාධ්‍ය ක්‍ෂේත්‍රය ආශ්‍රිතව සිදුකරන පර්යේෂණයක් බැවින් මෙහි කාලෝචිත වටිනාකමක් ඇත. ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය පැවති කාලයේදී ඒ ආශ්‍රිතව ජනමාධ්‍යයේ හැසිරීමට අදාළව විවිධ පර්යේෂණ සිදු වුවද යුද්ධය අවසන් වූවාට පසුව එවන් පර්යේෂණ බිහි වී ඇත්තේ අඩු වශයෙන් නිසා මෙම පර්යේෂණය තුළින් ක්‍ෂේත්‍රයට නව දැනුමක් එකතු වේ. එමෙන්ම මෙම පර්යේෂණය අනාගත ශාස්ත්‍රීය පර්යේෂණ කාර්යන් සඳහා ප්‍රයෝජනවත් වනු ඇති අතර මෙම පර්යේෂණයෙන් එළඹෙන නිගමන හා යෝජනා ජනමාධ්‍ය ක්‍ෂේත්‍රයේ ප්‍රවර්ධනයට යොදාගත හැක.